**මාර්ග ජාල වැඩි දියුණුකිරීමේ ප්‍රමුඛතා මාර්ග - 2 කොටස ව්‍යාපෘතිය - 2015**

---

මාර්ග ජාල වැඩි දියුණුකිරීමේ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 2 කොටසේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී.ලං.ර) සහ චීන සහයෝගීතා සංවර්ධන බැංකුව (චී.ස.බැ) අතර 2011 මාර්තු 31 දින එළඹි අංක 4500062212011110472 දරන ණය පහසුකම් ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) අනු ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

---

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුමට අනුව, එවකට මහා මාර්ග වරාය හා නාවික අමාත්‍යාංශයවූ ද, වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, කි.මී.619.72 ක ප්‍රමුඛතා මාර්ග වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීමයි. ණය පහසුකම් ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 61,438 කට සමාන එ.ජ.ඩො.මිලියන 556 ක් වූ අතර ඉන් රු.මිලියන 55,250 කට සමාන එ.ජ.ඩො. මිලියන 500 ක් සැපයීමට චීන සහයෝගීතා සංවර්ධන බැංකුව විසින් එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 ජූනි 28 දින ආරම්භ කරන ලද අතර 2014 ජූනි 28 දින නිම කිරීමට නියමිතව පැවතුණි. කෙසේවෙතත්, ණය වලංගු කාලසීමාව ගෙවීම් අවසන් වන තෙක් දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම්, ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවිය යුතු රු.මිලියන 1,980 ක මුදලක් ගිණුමට ගෙන නොතිබුණි.

(ආ) මාර්ග හා පාලම් පුනරුත්ථාපන වැඩ රු.මිලියන 71,055 ක පිරිවැයකට නිම කර තිබුණු අතර 2015 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණි. කෙසේවෙතත්, එම නිමකරන ලද වැඩ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කෙරීගෙන යන වැඩ ලෙස අඛණ්ඩව පෙන්වා තිබුණි.

## 3. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුල සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය පහසුකම් ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | ඇ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | ඇ.ඩො. මිලියන | රු. මිලියන | ඇ.ඩො මිලියන | රු. මිලියන |
| චීන සංවර්ධන බැංකුව | 500 | 55,250 | 13,753.00 | 103.10 | 13,752 | 490.18 | 63,080 |
| ශ්‍රී ලංකා රජය | 56 | 6,188 | 900.44 | - | 852 | - | 7,002 |
| එකතුව | 556 | 61,438 | 14,653.44 | 103.10 | 14,604 | 490.18 | 70,082 |

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති ලියකියවිලි වලට අනුව, නුවරඑළිය හා හම්බන්තොට දිස්ත්‍රික්ක තුළ කිලෝමීටර් 504.8 ක ජාතික මාර්ග සහ කිලෝමීටර් 85.01 ක ප්‍රාදේශීය මාර්ග, ගුවන්පාලම් 02 ක් පුනරුත්ථාපනය කිරීමට සහ ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද අරමුදල් යටතේ ප්‍රමුඛතා පදනම මත පාලම් 46 ක් පුළුල් කිරීමට හා නැවත ඉදිකිරීමට එමගින් සැලසුම් කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට කිලෝමීටර් 532.41 ක ජාතික මාර්ග සහ කිලෝමීටර් 97.30 ක ප්‍රාදේශීය මාර්ග, ගුවන්පාලම් 02 ක් සහ පාලම් 71 ක් නිමකර තිබුණි. කොන්ත්‍රාත්කරු ණය යටතේ වෙන් කරන ලද රු.මිලියන 500 මුදල ඉක්මවා රු.මිලියන 1,532 කට සමාන එ.ජ.ඩො. මිලියන 10.63 ක අතිරේක මුදලක් ඉල්ලුම් කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පොදු ලක්ෂණයක් වශයෙන්, සංකල්පික නිර්මිතයන් මත පදනම්ව අදාල වැඩ නිර්ණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මාර්ග පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් යටතේ වූ වැඩ විෂය පථය සහ ඒ පිළිබඳ ඇස්තමේන්තුගත පිරිවැය ක්‍රමයෙන් වෙනස්වී තිබුණි.

පරීක්ෂාකිරීම් වලදී නිරීක්ෂණයවූ එවැනි තත්ත්වයන් පහත පරිදි විස්තර වේ.

(අ) තැන්නේ කුඹුර - රිකිල්ලගස්කඩ - රාගල මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහාවූ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 7,307 ක මුදල පසුව රු.මිලියන 9,174 ක් වශයෙන් සංශෝධනය කර තිබුණි. කෙසේවෙතත්, කොන්ත්‍රාත්තුවේ වැඩ නිමවූ පසුවත් අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, ව්‍යාපෘතිය පාලම් හා බෝක්කු පුළුල් කිරීම සහ මාර්ගයේ පළල සහ මාර්ග උරහිස් පුළුල් කිරීම හේතුවෙන් රුඳවුම් බැම් ඉදිකිරීම සඳහා රු.මිලියන 1,002 ක් වටිනා විචලතා නියෝග 04 ක් අනුමත කර තිබුණි. මීට අමතරව රු.මිලියන 12.87 ක පිරිවැයකට ප්‍රවේශ මාර්ගයක් ප්‍රතිසංස්කරණය කිරීමේ අතිරේක වැඩ ක්‍රියාත්මක කර තිබුණි. නියමිත අදියරේදී විධිමත් බිම් මැනුම් කටයුතු ක්‍රියාත්මක කර තිබුණේ නම්, ඉහත සඳහන් අමතර පිරිවැය අවම කරගත හැකිව තිබුණි.

(ආ) විධිමත් විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සහ පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමෙන් තොරව මහියංගනය - දිඹුලාගල - දළුක්කනේ මාර්ගය පුනරුත්ථාපනය හා වැඩිදියුණුකිරීමේ කටයුතු ක්‍රියාත්මක කර තිබුණු බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් රු.මිලියන 2,202 ක පිරිවැයකට ඇස්තමේන්තුගත කර තිබුණද රු.මිලියන 1,746 ක පිරිවැයකට පුනරුත්ථාපනය හා වැඩිදියුණුකිරීමේ වැඩ නිමකර තිබුණි. එසේවුවත්, සංකල්පිත නිර්මිතයන් මත පිළියෙල කරන ලද ප්‍රමාණපත්‍ර මත පදනම්ව කොන්ත්‍රාත් පිරිනමා තිබුණු අතර ක්‍රියාකාරකම්වලින් සමහරක් කප්පාදු කළ හැකි බව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ පැහැදිලිකිරීම විය.

(ඇ) මූලික ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 3,623 ක් වූ නාගොඩ - කලවැල්ලව - බෙල්ලපිටිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ මූලික වැඩ විෂය පථය තුළ ඇතුළත්ව නොතිබුණු පාලම් 11 ක් ඉදිකිරීම නිසා ඇස්තමේන්තුව රු.මිලියන 4,122 ක් දක්වා සංශෝධනය කර තිබුණි. තවද, ව්‍යාපෘතිය අතිරේක ක්‍රියාකාරකම් හේතුවෙන් කොන්ත්‍රාත්තුව යටතේ වැඩ නිමකිරීමට දින 287 ක් දීර්ඝ කිරීම් ලබාදී තිබුණි. කෙසේවෙතත්, අවිනිශ්චිතතාවයන් සඳහා ප්‍රමාණපත්‍රවල වෙන්කරන ලද ප්‍රතිපාදන ඉක්මවා සිදුකරන ලද විචලතා නියෝග සඳහා 2015 දෙසැම්බර් 31 දින වනවිට අදාල අනුමැතීන් ලබාගෙන නොතිබුණි.

(ඈ) රු.මිලියන 3,370 ක් වූ බදුල්ල කරමැටිය - ආඳාවුල්පත මාර්ගය මාර්ගය වැඩිදියුණු කිරීමේ සහ පුනරුත්ථාපනය කිරීමේ මූලික ඇස්තමේන්තුගත පිරිවැය අතිරේක වැඩ හේතුවෙන් රු.මිලියන 5,073 දක්වා සංශෝධනය කරන ලදී. සංකල්පනාත්මක නිර්මිත මත පදනම්ව ප්‍රමාණපත්‍ර පිළියෙල කිරීම නිසා ඇස්තමේන්තුගත පිරිවැයට වඩා සියයට 50.53 කින් කොන්ත්‍රාත් පිරිවැය වැඩිවී තිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 වගන්තිය පරිදි රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව ප්‍රවේශ මාර්ග සහ මහියංගනය ජනාධිපති නිල නිවසේ අභ්‍යන්තර මාර්ග සහ මහියංගනය නගරයේ සේවා මාර්ග පුනරුත්ථාපනය කිරීමේ හා වැඩිදියුණුකිරීම් ඇතුළත්ව රු.මිලියන 206 ක ඇස්තමේන්තුගත පිරිවැයකට බිබිල - උරනිය - මහියංගනය මාර්ගයේ පුනරුත්ථාපනය කිරීමේ අතිරේක වැඩ සහ වැඩිදියුණුකිරීමේ වැඩ ක්‍රියාත්මක කර තිබුණි. පුනරුත්ථාපනය කිරීමේ හා වැඩිදියුණුකිරීමේ වැඩ රු.මිලියන 185 කට නිමකරන ලද අතර එය පිරිවැය ඇස්තමේන්තු තාත්වික ආකාරයට පිළියෙල නොකරන ලද බව තහවුරු කෙරුනි.

**3.4 මතභේදාත්මක ස්වභාවයේ කරුණු**

--------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද බිල්පත් නිරවුල් කිරීම ප්‍රමාදවීම හේතුවෙන් කොන්ත්‍රාත් කොන්දේසි 14.8 උපවගන්තිය පරිදි ව්‍යාපෘතිය විසින් රු.මිලියන 229.27 ක් සහ එ.ජ.ඩො. 393,307 කට මුදලක් ප්‍රමාද ගාස්තු වශයෙන් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ උපදේශක සේවා අත්පොත 2007 හි අංක 1.2.1 වගන්තියට අනුව සෑම ව්‍යාපෘතියක් සඳහාම උපදේශකයන් වෙන වෙනම බඳවාගත යුතුය. කෙසේවෙතත්, මෙම ව්‍යාපෘතිය විසින් මාර්ගජාල වැඩිදියුණුකිරීමේ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 03 සඳහා පත් කළ උපදේශකවරුන්ගේ සේවාව ලබාගෙන තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 95.55 ක සමස්ථ උපදේශන ගාස්තු එක් එක් ව්‍යාපෘතිය සඳහා සපයන ලද සේවාවන් මත වෙන් කිරීමෙන් තොරව මෙම ව්‍යාපෘතියට අයකර තිබුණි.

(ඇ) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබා ගත් ණය මුදලෙන් මෙම ව්‍යාපෘතිය යටතේ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 1,100 ක මුදලක් වෙන් කර තිබුණි. කෙසේවෙතත්, ණය පියවීම සම්බන්ධයෙන් සිදුකළ වැඩ පිළිවෙල විගණනයට පැහැදිලි කර නොතිබුණි.